# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1589 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 16/10 /2024 පැය 1130

**මාධ්‍ය නිවේදනය**

**01. හෙරොයින් ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් බැංකු ගතකල සැකකරුවෙකු අත්අඩංගුවට - නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය.**

හොරොයින් ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් තම බැංකු ගිණුම වෙත තැන්පත් කරගත් පුද්ගලයෙකු සම්බන්ධයෙන් නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසයට ලද තොරතුරක් මත එම කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් විමර්ශන ආරම්භ කර තිබිණි. ඒ අනුව සිද්ධියට සම්බන්ධ සැකකරු 2024.10.15 දින සවස් කාලයේ නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන කුඩා ගල්ගමුව, කුරුණෑගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු 2021 වර්ෂයේ අප්‍රේල් මස කුරුණෑගල ප්‍රදේශයේ පුද්ගලික බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කර එම ගිණුමට 2021 සැප්තැම්බර් මස දක්වා කාලය තුල රුපියල් එක් කෝටි හතලිස් හය ලක්ෂයකට අධික මුදලක් තැන්පත් කරවාගෙන එම මුදලෙන් රුපියල් එකකෝටි තිස් හත් ලක්ෂයක පමණ මුදලක් ආපසු ලබාගෙන ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෙම මුදල් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද මුදල් බවට සිදුකරන ලද විමර්ශනයේදී නිරීක්ෂණය වී ඇති අතර නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. සැකකටයුතු මරණයක් - හලාවත පොලිස් වසම.

2024.10.16 වන අද දින අළුයම් කාලයේදී හලාවත පොලිස් වසමේ හලාවත කුරුණෑගල මාර්ගයේ මුගුණුවටවන ප්‍රදේශයේදී මාර්ගය මත වැටීසිටි කාන්තාවක් ප්‍රදේශවාසින් විසින් හලාවත රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට හලාවත පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 49 ක් වූ වන මුගුණවටවන ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය සමඟ සමීප ඇසුරු කළ පුද්ගලයෙකු හා එම අවස්ථාවේ මාර්ගයේ කාර් රථයකින් ගමන් කල පුද්ගලයෙකු සැකපිට අත්අඩංගුවට ගෙන ඇත. හලාවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.